# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1687/28 - 2011 ජනවාරි 05 වැනි බදාදා - 2011.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත**

2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 5 වැනි, 9 වැනි සහ 17 වැනි වගන්ති සමග කියවිය යුතු 204 වැනි වගන්තිය යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝග.

රිෂාඩ් බදියුදීන්, පා. ම.
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2011 ජනවාරි මස 04 වැනි දින,
කොළඹ,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

නියෝග

01. මෙම නියෝග "2011 අංක 01 දරන බුද්ධිමය දේපළ නියෝග" යනුවෙන් හඳුන්වනු ලබන අතර, ඒවා 2011 ජනවාරි මස 04 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

02. (මෙහි මින් මතු "සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන) විකාශන සංවිධානයක් විසින් ගීතයක් හෝ එහි සැලකිය යුතු කොටසක් විකාශනය කරන අවස්ථාවක දී, ඒ සංවිධානය එම ගීතයේ පද රචකයාට, සංගීතඥයාට හා ගායකයාට 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ විධි විධානවලට යටත්ව පහත දැක්වෙන අවම ගාස්තු ගෙවීම කළ යුතු ය:—

| | | |
|---|---|---|
| (I) (අ) | ගුවන් විදුලියේ විකාශනය වන ගීතයක් සම්බන්ධයෙන් එක් විකාශන වාරයක් සඳහා: | *රු. ශත* |
| | (i) පද හෝ එහි සැලකිය යුතු කොටසක් සඳහා | 3 00 |
| | (ii) සංගීතමය කෘතියක් හෝ එහි සැලකිය යුතු කොටසක් සඳහා | 3 00 |
| | (iii) ගායනයක් හෝ එහි සැලකිය යුතු කොටසක් සඳහා | 3 00 |
| (ආ) | ගුවන් විදුලියේ විකාශනය වන පද ආශ්‍රිත නොවූ සංගීතමය කෘතියක් හෝ එහි සැලකිය යුතු කොටසක් එක් විකාශන වාරයක් සඳහා | 3 00 |
| (II) (අ) | රූපවාහිනියේ විකාශනය වන ගීතයක් සම්බන්ධයෙන් එක් විකාශන වාරයක් සඳහා: | |
| | (i) පද හෝ එහි සැලකිය යුතු කොටසක් සඳහා | 10 00 |
| | (ii) සංගීතමය කෘතියක් හෝ එහි සැලකිය යුතු කොටසක් සඳහා | 10 00 |
| | (iii) ගායනයක් හෝ එහි සැලකිය යුතු කොටසක් සඳහා | 10 00 |
| (ආ) | රූපවාහිනියේ විකාශනය වන පද ආශ්‍රිත නොවූ සංගීතමය කෘතියක් හෝ එහි සැලකිය යුතු කොටසක් එක් විකාශන වාරයක් සඳහා | 10 00 |
| (III) (i) | ගීතයක් රූපරචනය කර එම රූපරචනය හෝ එහි සැලකිය යුතු කොටසක් රූපවාහිනියේ වරක් විකාශනය වන අවස්ථාවක එම රූපරචනයේ නිෂ්පාදකයාට | 10 00 |
| (ii) | පද ආශ්‍රිත නොවූ සංගීත කෘතියක් රූපරචනය කර, එම රූපරචනය හෝ එහි සැලකිය යුතු කොටසක් රූපවාහිනියේ වරක් විකාශනය වන අවස්ථාවක එම රූපරචනයේ නිෂ්පාදකයාට | 10 00 |

එසේ වුව ද, ඒ ඒ පාර්ශ්වයන් ට වඩාත් වාසිදායක වන පරිදි ගාස්තු වෙනස් කිරීම සඳහා වූ යම් ගිවිසුමකට ඒ සංවිධානය සහ පාර්ශ්වයන් ඇතුළත්වීම වැළැක්වීම හෝ එයට බාධා කිරීම නොකළ යුතු ය.

03. (අ) 2 වැනි නියෝගයේ නිශ්චිතව සඳහන් කරන ලද ගෙවීම් සංවිධානය විසින් පහත සඳහන් පරිදි සිදුකළ යුතු ය:—

(i) සෘජුවම ගෙවීමට හිමිකම් ලබන තැනැත්තා වෙත; හෝ
(ii) ඔහු සාමාජිකයෙකු වන සාමූහික සංගමය වෙත.

(ආ) ගෙවීමට හිමිකම් ලබන තැනැත්තා හෝ ගෙවීමට හිමිකම් ලබන සාමූහික සංගමය එම ගෙවීම කළ යුතු පාර්ශ්වය පිළිබඳව සංවිධානයට ලිඛිතව දැන්විය යුතු ය.

04. මෙම නියෝගවල කාර්යය සඳහා පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස "විකාශන සංවිධානය", "සාමූහික සංගමය" සහ "කෘතිය" යන අර්ථ දැක්වීම සඳහා එම පද වෙනුවෙන් 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ දැක්වෙන අර්ථය ම තිබිය යුතු ය.

01-411

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.